# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**අධ්‍යක්ෂ - පාලන හා ආයතනික කටයුතු තනතුරට බඳවා ගැනීම (අභ්‍යන්තර )**

ඉහත තනතුර සඳහා සුදුසුකම් ලත් අභ්‍යන්තර අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. <u>රැකියා විස්තරය සහ වගකීම්</u>**

1. මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති සහ පටිපාටි සංවර්ධනය කිරීම.
2. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම.
3. නිසි පුහුණු සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
4. ප්‍රසම්පාදන කාර්යයන් සහතික කිරීම.
5. සැලසුම්/ප්‍රගති අධීක්ෂණය සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සමස්ත අධීක්ෂණ කටයුතු සිදු කිරීම.
6. මාධ්‍ය, ප්‍රචාරණ සහ ප්‍රකාශන කටයුතු අධීක්ෂණය කිරීම සහ මෙහෙයවීම.

**2. <u>අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද:</u>**

කළමනාකරණය හෝ රාජ්‍ය පරිපාලනය හෝ ව්‍යාපාර පරිපාලනය හෝ මානව සම්පත් කළමනාකරණය ක්ෂේත්‍රයේ 1 වන හෝ 2 වන පන්තියේ ගෞරව උපාධියක් සහ පශ්චාත් උපාධියක් සමඟ කළමනාකරණ මට්ටමේ වසර 20 ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර , ඉන් අවුරුදු 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සතුටුදායක සේවා පළපුරුද්දක් සහිත වීම .

හෝ

කළමනාකරණය හෝ රාජ්‍ය පරිපාලනය හෝ ව්‍යාපාර පරිපාලනය හෝ මානව සම්පත් කළමනාකරණය ක්ෂේත්‍රයේ පළමු හෝ දෙවන පන්තියේ ගෞරව උපාධියක් සහ එම ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වයක් සමඟ කළමනාකරණ මට්ටමේ වසර 20 ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර , ඉන් අවුරුදු 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සතුටුදායක සේවා පළපුරුද්දක් සහිත වීම .

හෝ

කළමනාකරණය හෝ රාජ්‍ය පරිපාලනය හෝ ව්‍යාපාර පරිපාලනය හෝ මානව සම්පත් කළමනාකරණය ක්ෂේත්‍රයේ උපාධියක් සහ පශ්චාත් උපාධියක් සමඟ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස අවම වශයෙන් අවුරුදු 07 ක සතුටුදායක සේවා පළපුරුද්දක් සහිත නිලධාරියකු වීම .

හෝ

කළමනාකරණය හෝ රාජ්‍ය පරිපාලනය හෝ ව්‍යාපාර පරිපාලනය හෝ මානව සම්පත් කළමනාකරණය ක්ෂේත්‍රයේ මූලික උපාධියක් සහ එම ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය සමඟ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස අවම වශයෙන් අවුරුදු 07 ක සතුටුදායක සේවා පළපුරුද්දක් සහිත නිලධාරියෙකු වීම.

**3. බඳවා ගැනීමේ පටිපාටිය**

බඳවා ගැනීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරේ.

**4. වැටුප් පරිමාණය :**

TRC 1.3 -Rs. 262,752 (10x11,261) -(10x12,669) – 502,052

**5. පොදු කොන්දේසි :**

I. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පත්වීම් සංග්‍රහයේ VI වන පරිච්ඡේදයේ 77 වන වගන්තියට අනුව මෙම පත්වීම වසරක වැඩ බලන කාලයකට යටත් වේ.

II. බඳවා ගැනීම් සම්පූර්ණයෙන්ම අවලංගු කිරීම හෝ කල් දැමීම තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතුවේ.

III. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

IV. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා බඳවා ගැනීමට නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

V. සම්මුඛ පරීක්ෂණ ලකුණු දීමේ ක්‍රමය පරිශීලනය සඳහා මෙහි අමුණා ඇත.

**6. අයදුම් කිරීමේ ක්‍රමය:**

අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත් අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික කළ පිටපත් සහ අංශ ප්‍රධානියාගේ නිර්දේශය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර පාලන හා ආයතනික කටයුතු අංශයට ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2025.10.02 වේ.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක. 276, ඇල්විටිගල මාවත
කොළඹ 08